## බුදුසමයට දරිද්‍රතාව නිශේධනය කළ හැකි ද?

දිනේෂ මධුශංඛ රත්නායක[1]

**හැඳින්වීම සහ පර්යේෂණ අරමුණ**

ගෝලීය සංවර්ධන සන්දර්භය තුළ දරිද්‍රතාව යන සඞ්කල්පය වර්තමානය වන විට සංවර්ධන ගැටලුවක් වශයෙන් සමාජයේ සෑම ක්ෂේත්‍රයකට ම බලපෑම් ඇති කර තිබේ. දරිද්‍රතාව යන සඞ්කල්පය ගෝලීය වශයෙන් හඳුනා ගැනීමේ දී මුල්කාලීන ව දරිද්‍රතාව යන්න මූලික අවශ්‍යතා සපුරා ගැනීම සඳහා වන සම්පත් හිඟතාව ලෙස හඳුනා ගනු ලැබූ අතර, වර්තමානය වන විට එය විස්තීර්ණ සඞ්කල්පයක් බවට පත්ව තිබේ. 1998 දී එක්සත් ජාතීන්ගේ සංවිධානය නිර්වචනය කරන ආකාරයට දරිද්‍රතාව යනු **"පුද්ගලයන්ට නැතහොත් පවුල් ඒකකයන්ට සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සේ සලකනු ලබන භාණ්ඩ හා සේවා ලබා ගැනීමට ඇති නො හැකියාව යි."** එනම් දළ වශයෙන් අවම ජීවන තත්ත්වයක් ළඟා කර ගැනීමට අවශ්‍ය මනා පෝෂණයක් නො ලැබීම සම්පත් හිඟතාව වේ. ලෝකයේ බොහෝ සංවර්ධනය වෙමින් පවතින රටවල් සහ ශ්‍රී ලංකාව ද සමාජ හා ආර්ථික වශයෙන් මුහුණ දෙන ප්‍රධානම ගැටලුව වන්නේ දරිද්‍රතාව යි. දරිද්‍රතාව පිළිබඳ සාකච්ඡා ඇරඹෙනුයේ 1940 දශකයේ සිට ය. ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව තුරන් කිරීම හා අසමානතාව අවම කිරීම සඳහා වන අවශ්‍යතාව 1940 දශකයේ සිට ඉස්මතු වූ බව පෙනේ. නිදහස ලැබූ අවධියේ සිටම ප්‍රතිපත්ති සම්පාදකයන්ගේ සහ සංවර්ධන පර්යේෂකයන්ගේ අවධානයට යොමු වුව ද දිළිඳුකම පිළිබඳ ගැටලුව තවමත් ශ්‍රී ලංකාවේ සැලකිය යුතු ගැටලුවක් ව පවතියි. දරිද්‍රතාව නිශේධනය කිරීමට එදා මෙදාතුර සලකා බැලූ සියලු අත්හදා බැලීම් ව්‍යර්ථක ව ඇත්තේ විවිධ හේතු නිසා ය. එබැවින් ආගමික දෘෂ්ටිකෝණය පසෙකලා දරිද්‍රතාව නැති කිරීමට බුදුසමයෙන් ලද හැකි උපයෝගීතාව සාකච්ඡා කිරීම වැදගත් වේ. බුදුසමය පෙන්වා දෙනු ලබන්නේ හේතුඵල ධර්මතාව යි. දිළිඳුකම ඵලය නම් එයට මුල් වූ හේතුව හෝ හේතු ගණනාවක් තිබිය හැකි ය. එම නිසා දිළිඳුකම නැති කිරීමට නම් බුදුසමයට අනුව දිළිඳුකම ඇති කරවන හේතුකාරකධර්ම නිශේධනය කළ යුතු ය. සූත්‍රදේශනාවන් පරීක්ෂා කිරීමේ දී ආර්ථික සුරක්ෂිතතාව වෙනුවෙන් කරුණු කාරණා රාශියක් භාග්‍යවතුන් වහන්සේ දේශනා කර තිබෙන බව පෙනේ. එම කරුණු දිළිඳුකම තුරන් කිරීමට ප්‍රායෝගික තලයේ ක්‍රියාත්මක කළ යුතු ආකාරය පිළිබඳ සාකච්ඡා කිරීම වඩා වැදගත් වේ. එසේ ම ඒ සඳහා බුදුසමයෙන් ලබා දිය හැකි ප්‍රායෝගික විසඳුම් පිළිබඳ ව අධ්‍යයනය කිරීම හා බෞද්ධ ආර්ථික දර්ශනයේ ආවසානික පරමාර්ථය කුමක් දැයි අධ්‍යයනය කිරීම  මෙහි අරමුණ යි.

**පර්යේෂණ ගැටලුව**

බුදුසමයට දරිද්‍රතාව නිශේධනය කළ හැකි ද?

[1]. උපාධි අපේක්ෂක, ශ්‍රී ලංකා බෞද්ධ හා පාලි විශ්වවිද්‍යාලය, හෝමාගම. *Madusankadinesh444@gmail.com*

**මූලාශ්‍රය භාවිතය හා සීමාව**

මෙම පර්යෙෂණය සාර්ථක කර ගැනීමට ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය භාවිත කරන ලදී. ඒ අනුව අඞ්ගුත්තරනිකාය, ඛුද්දකනිකාය, සංයුත්තනිකාය, ජනහිතකාමී ආර්ථික සංවර්ධනය, දිළිඳුකම පිළිබඳ බෞද්ධ මතය, බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය, සමෘද්ධි වැඩසටහන, ජබ්බාර්, ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ විශ්ලේෂණය වැනි ප්‍රාථමික හා ද්විතීයික මූලාශ්‍රය මෙහි දී භාවිත කරන ලදී. ශ්‍රී ලාංකිකයන්ගේ ආර්ථික දරිද්‍රතාව හා දරිද්‍රතාව පිළිබඳ බුදුසමයේ මතය මෙහි පර්යේෂණ සීමාව යි.

**පර්යේෂණ සාකච්ඡාව/ප්‍රතිඵල**

එක්සත් ජාතීන්ගේ සංවිධානය **"පුද්ගලයන්ට නැතහොත් පවුල් ඒකකයන්ට සමාජය තුළ යහපත් ජීවිතයක් ගත කිරීමට අවශ්‍ය සේ සලකනු ලබන භාණ්ඩ සහ සේවා ලබා ගැනීමට ඇති නො හැකියාව"** දරිද්‍රතාව ලෙස අර්ථකථනය කරයි. ඉංග්‍රීසි භාෂාවෙන් දරිද්‍රතාව සඳහා යෙදෙන වචනය වන්නේ 'poverty' යන්න යි. (The State of beling very poor, The state of lacking in a particular quality) බොහෝ දුප්පත්, නියමිත තත්ත්වයේ අඩුපාඩුකම් ආදී අර්ථ එයින් ගම්‍ය වේ, (Hawker, 2006). ලෝක බැංකුව **"හොඳින් ජීවත්වීමේ අවස්ථාව පැහැදිලි ලෙස අහිමිවීම"** දරිද්‍රතාව ලෙස අර්ථ දක්වා තිබේ. හොඳින් ජීවත්වීම යන්න අර්ථ දක්වන රොබට් චේම්බර්ස් පෙන්වා දෙන්නේ දරිද්‍රතාව අවාසි පොකුරක් බව යි. මෙම අවාසි පොකුරට ඔහු කරුණු පහක් ඇතුළත් කර දක්වා තිබේ.

1. ආදායම් දරිද්‍රතාව,
2. හුදකලා වීම,
3. කායික දුබලතාව,
4. නියඟය,
5. ගංවතුරෙන් පීඩාවට පත්වීම, ආදිය එයට එක්කර තිබේ.

**දිළිඳු වීමට හේතු**

බුදුදහමේ ඉගැන්වීම් දෙස ගැඹුරින් අවධානය යොමු කිරීමේ දී අවබෝධ වන කාරණයක් වනුයේ දිළිඳුකම සඳහා කර්මයේ ඍජු සහ වක්‍ර බලපෑමක් ඇති බව යි. පරිත්‍යාගශීලීන් දරිද්‍රතාවෙන් මිදුණවුන් වීමටත් මසුරු පුද්ගලයන් දරිද්‍රතාවට පත් වීමටත් කර්මය බලපාන බව චුල්ලකම්මවිභඞ්ග සූත්‍රයේ දී පෙන්වා දී තිබේ. අය-වැය තුලනයෙන් යුතුව ජීවත් වීමට බුදුසමය අවධාරණය කරයි. දිළිඳුවීමට බලපාන ප්‍රධාන කරුණු හතරක් ව්‍යග්ඝපජ්ජ සූත්‍රයේ පෙන්වා දී තිබේ.

**"එවං සමුප්පන්නානං ව්‍යග්ඝපජ්ජ භොගානං චත්තාරි අපායමුඛානි හොති. ඉත්ථිධුත්තො හොති සුරාධුත්තො අක්ඛධුත්තො පාපමිත්තො පාපසහයො පාපසම්පවඞ්කො"** සිඟාලෝවාද සූත්‍රයේ දී ද පුද්ගලයෙකු දිළිඳුවීමට හේතුවන කරුණු කිහිපයක් දේශනා කොට තිබේ. **"සුරාමෙරයමජ්ජපමාදට්ඨානානුයොගො ඛො ගහපති භොගානං අපායමුඛං, විකාලවිසිඛාචරියානුයොගො**

**භොගානං අපායමුඛං, සමජ්ජාභිචරණං භොගානං අපායමුඛං, ජූතප්පමාදට්ඨානුයොගො භොගානං අපායමුඛං, පාපමිත්තානුයොගො භොගානං අපායමුඛං, ආලස්‍යානුයොගො භොගානං අපායමුඛං."**

මහානිදාන සූත්‍රයට හා කලහවිවාද සූත්‍රවලට අනුව මෙම සමාජ ගැටලු සියල්ලට මූලික වන කාරණය වන්නේ තණ්හාව යි. තණ්හාව හේතු කොටගෙන අතීත, වර්තමාන වශයෙන් සමාජගත ගැටලු රාශියක් උද්ගතව තිබේ. යම් කුලයක් හෙවත් පවුලක් දිළිඳුභාවයට පත්වීමට බලපාන තවත් කරුණු අටක් සිඟාලෝවාද සූත්‍රයෙහි ම සඳහන්ව තිබේ.

1. රජය විසින් යමෙකුගේ දේපළ පවරා ගැනීම (**රාජතො වා කුලානි උපඝාතං ගච්ඡන්ති**)
2. සොරු විසින් පැහැරගෙන යාම (**චොරතො වා**)
3. ගින්නෙන් විනාශ වීමෙන් (**අග්ගිතො වා**)
4. ජලයෙන් විනාශ වීමෙන් (**උදකතො වා**)
5. තැන්පත් කළ ධනය ලබා ගැනීමට නොහැකි වීමෙන් (**නිහිතං වා නාධිගච්ඡන්ති**) මූල්‍ය ආයතන බිඳ වැටීමෙන් හෝ වංචනික පුද්ගලයන්ට හසුවීම නිසා
6. යම් කර්මාන්තයකට ධනය ආයෝජනය කළ පසු වරදවා යොදන ලද සේවකයෝ වැඩ අත් හැරීමෙන් (**දුප්පයුත්තා වා කම්මන්තං ජහන්ති**) අද්‍යතනයේ ක්‍රියාත්මක වන වැඩ වර්ජන ආදිය මෙහි ලා ගැනේ.
7. සම්පත් විසුරුවා හරිනා වනසාලන කුල අඟුරක් (ධනය නසන කෙනෙක්) පවුලක් ඇතිවීම, (**කුලානං වා කුලංගාරො උප්පජ්ජති, යොතෙ භොගෙ විකිරති විධමති විද්ධංසෙති**)
8. අනිත්‍ය ධර්මතාවට යටත් වීමෙන් (**අනිච්චතාය**)

චක්කවත්තිසීහනාද සූත්‍රයේ දී දිළින්දන්ට ධනය නො ලැබීම නිසා සොරකම වැඩි වූ බවත් සොරකම වැඩිවීම නිසා අවි ආයුධ දැරීමට සිදු වන බවත් අවි ආයුධ වැඩි වී ගිය කල්හි ප්‍රාණඝාතය වැඩි වූ බව පෙන්වා දෙයි. "**අධනානං ධනෙ අනුප්පදියමානෙ දාළිද්දියං වෙපුල්ලමගමාසි**" දිළින්දන්ට ධනය නො දෙනු ලබන කල්හි දිළිඳු බව වැඩි විය. **"දාළිද්දියං වෙපුල්ලං ගතෙ අඤ්ඤතරො පුරිසො පරෙසං අදින්නං ථෙය්‍යසඞ්ඛාතං ආදියි"** මේ ආදි වශයෙන් චක්කවත්තිසීහනාද සූත්‍රයේ දිළිඳුකම ඇතිවන, දිළිඳුබව වැඩි වන ආකාරය පෙන්වා දී තිබේ. එම කාරණා අද්‍යතන සමාජයට ද ගළපා ගැනීමට මනා ය. මේ ආදී කරුණු කාරණා රැසක් ම පුද්ගල හා සමාජ දිළිඳුකමට බලපාන බව බුදුදහම පෙන්වා දෙයි.

**දිළිඳුකම තුරන් කිරීමෙහි ලා බුදුසමයේ කාර්යභාරය**

චක්කවත්තිසීහනාද සූත්‍රයේ පෙන්වා දෙන ආකාරයට දිළිඳුකමට හේතුව ධනය නොමැති වීම නම් ඒ සඳහා යෙදිය යුතු පිළියම වන්නේ දිළින්දන්ට ධනය ලබාදීම යි. "**දිළින්දන්ට ධනය නො දුන්නේ ය. දිළින්දන්ට ධනය නො දෙනු ලබන කල්හි දිළිඳුබව මහත් බවට පත්විය. දිළිඳුකම මහත් ව ගිය කල එක් මිනිසෙක් අන්සතු නො දුන් දෙයක් සොර සිතින් ගත්තේ ය.**" සමාජ ප්‍රශ්න විශාල සඞ්ඛ්‍යාවකට දිළිඳුකම හේතුවක් වේ. එම නිසා බුදුදහම අවධාරණය කරනුයේ හේතුවට පිළියම් කළ යුතු බවත් ඵලයට පිළියම් කිරීම නිෂ්ප්‍රයෝජනවත් බවත් ය. දිළිඳුකම නැති කිරීමට නම් දිළිඳු ජනගහනය අඩු කළ යුතු ය. දිළිඳුකම

නිශේධනය කිරීමට භාග්‍යවතුන් වහන්සේ මනා වූ ක්‍රමයක් පෙන්වා දී තිබේ. දිළිඳුකම තුරන් කිරීමට රජයේ හැසිරීම සහ රාජ්‍ය ප්‍රතිපත්තිවල වටිනාකම බුදුන් වහන්සේ මෙහි දී අවධාරණය කර තිබේ.

1. කෘෂිකර්මයෙහි හා ගව පාලනයේ නියුතු වූ අයට බිත්තර වී, බීජ වී වර්ග ආහාරපාන සැපයීය යුතු ය. අවශ්‍ය වේලාවට බීජ වර්ග, පැළ වර්ග, පොහොර ආදිය සැපයේ නම් හා මෙම ක්ෂේත්‍රයේ නියුතු වුවන්ට ආහාරපාන සහනදායී මිලට ලබා ගැනීමට හැකිවන ආකාරයට ක්‍රමෝපායන් සැලැස්විය හැකි නම් ඔවුන් තම කෘෂි කටයුතු ආදී කර්මාන්ත කෙරෙහි තව තවත් උනන්දු වන බවත් ආපදා අවස්ථාවන්හි රජය විසින් සහනදායී වැඩ පිළිවෙළක් අනුගමනය කළ යුතු බව ද භාග්‍යවතුන් වහන්සේ පෙන්වා දී තිබේ. මේ ආදී වශයෙන් අවශ්‍ය කටයුතු සලසා කෘෂි කටයුතු ගවපාලන ආදී රටේ ආර්ථිකය ශක්තිමත් කරන අංශ වර්ධනය වන විට ඒ ආශ්‍රිත නව රැකියා සහ භෝග අතිරික්තයක් ඇති වේ. රටේ ආහාර හිඟය, පෝෂණ ඌනතා ඇති නො වේ.

2. දෙවනුව රටේ ආර්ථිකය හසුරුවන වෙළඳාම හා වෙළෙන්දන් නඟා සිටුවිය යුතු ය. බුදුන් වහන්සේ පෙන්වා දෙන ආකාරයට වෙළඳාම සඳහා විශාල ප්‍රාග්ධනයක් අවශ්‍ය ය. එබැවින් ණය ක්‍රම මඟින් හෝ ප්‍රදානය මඟින් වෙළෙන්දන්ට ප්‍රාග්ධනය ලබාදිය යුතු ය. වෙළෙන්දන් සතුව විශාල ප්‍රාග්ධනයක් ඇති විට ගොවීන්ගේ සෑම භෝගයක් ම  ඉතා ඉක්මනින් වෙළඳපොළට පැමිණේ. ඉල්ලුම සහ සැපයුම ධනාත්මක වන විට වෙළඳාම ආශ්‍රිතව ද සෘජු සහ වක්‍රාකාර රැකියා ඇති වේ. ඇතැමෙක් ආනයන ලෙස ද ඇතමෙක් අපනයන ලෙස ද රටට විනිමය ගෙන ඒම සඳහා වෙළඳාම සෘජු මාර්ගයක් කරගනි. ගොවියාට ගොවිතැනටත් වෙළෙන්දාට වෙළඳාමටත් අවශ්‍ය පරිසරය ක්‍රමානුකූල ව සැකසෙන විට අනෙක් පසින් රාජ්‍ය අංශය කාර්යක්ෂම විය යුතු ය.

3. රාජ්‍ය අංශය වනාහි රටේ සෑම ක්ෂේත්‍රයකට ම සෘජුව හා වක්‍රව සම්බන්ධ වේ. නීති, අණපනත් ආදිය සම්පාදනය කරන්නේ ද රාජ්‍ය හිතකාමී හා ජන හිතකාමී ප්‍රතිපත්ති සැලසුම් සකසන්නේ ද රාජ්‍ය සේවකයන් ය. එබැවින් රාජ්‍ය සේවයේ නියුතු වූවන්ට සුදුසු හා ප්‍රමාණවත් වේතන ලබාදීම කළ යුතු ය. එවිට තෘප්තිමත්ව හා කාර්යක්ෂම ලෙස ඔවුන් කටයුතු කරන බවත් රටේ සංවර්ධන ක්‍රියාවලියට රාජ්‍ය අංශයේ කාර්යක්ෂමභාවය වැදගත් බවත් කූටදන්ත සූත්‍රයේ පෙන්වා දී තිබේ.

දිළින්දන්ට ධනය ලබාදිය යුතු බවට භාග්‍යවතුන් වහන්සේ යෝජනා කරනුයේ ඔවුන් දිළින්දන් ලෙස ජීවිතාන්තය දක්වා රජය විසින් ධනය ලබා දෙමින් බලාගත යුතු ය යන පරමාර්ථයෙන් නො ව රජය විසින් ලබාදෙන ධනය ගෙන, ඔහුට තමන්ට කළ හැකි රැකියාවක් සඳහා එය යෙදවීමට ය. ගොවිතැන, පශු පාලනය, වෙළඳාම ආදී කර්මාන්ත කෙරෙහි යොමු විය හැකි ය. සුදුසුකම් පරිදි ඔහුට හෝ ඇයට රාජ්‍ය සේවයට වුව ද ඇතුළත් විය හැකි ය. ධනය ලබා දෙමින් ජීවිත කාලයේ ම රජය විසින් දිළින්දන් පෝෂණය කිරීම බුදුදහමට එකඟ නො වන කරුණකි. අප රටේ ද වාර්ෂික ව සමෘද්ධිය හා ජනසවිය

වැනි වැඩසටහන් හරහා රටේ ජනතාවට සහන ලබා දුන්න ද ඔවුන් ඒවා දිළිඳුකමෙන් ඉවත්වීම සඳහා ආයෝජනය නො කෙරේ. අවම වශයෙන් එවැනි ආකල්පමය වෙනසක් වත් ඇති නො වීම රටේ දිළිඳු ජනගහනය බහුලවීමට හේතු වී ඇත. රජයන් පවා දිවි ඇති තෙක් දිළින්දන්ට එවැනි මුදල් දෙනවා හැර ප්‍රතිපත්ති වශයෙන් හෝ ආකල්පමය වශයෙන් දිළිඳුභාවයෙන් ගොඩ ඒමට එම මුදල් ආයෝජනය කළයුතු බවට පෙළඹවීමක් හෝ නොමැත. සමෘද්ධිලාභීන් ප්‍රමාණය වැඩි කිරීමට වඩා කූටදන්ත සූත්‍රයේ එන කාරණා බෙහෙවින් ප්‍රායෝගක ය. දිළිඳුකම ඇතිවීමට ප්‍රධාන හේතුවක් වන්නේ සම්පත් බෙදී යාමේ විෂමතාව යි. එම නිසා ධනය පාවිච්චි කළ යුත්තේ තනි තනිව ම නො ව සාමූහික ව බවත් එසේ නො වුණහොත් දිළිඳුකම පැතිරෙන බවත් කොසම්බි සූත්‍රයේ දී බුදුන් වහන්සේ වදාරා තිබේ. ඉණ සූත්‍රයේ දී දිළිඳුකම ගිහියෙකුට දුකක් බවත් තම තරුණ හා ශක්තිමත් වියේ දී ධනය රැස් කිරීමට උත්සාහ කළයුතු බවත් පෙන්වා දී තිබේ.

**පර්යේෂණ සමාලෝචනය**

කැලිෆෝනියාවේ ආණ්ඩුකාර ජෙම් බ්‍රවුන් මෙන් ම පිට් ජෝ කප්රා වැනි වියතුන්ගේ පවා ඇගයුමට පාත්‍ර වූ විශිෂ්ට කෘතියක් රචනා කළ ඊ. එෆ්. ෂුමාකර් සිය "**පුංචි නම් ලස්සනයි**" (***Small is beautiful***) නම් ග්‍රන්ථයේ දී ආර්ථිකවිද්‍යානුකූල ව බෞද්ධ ආර්ථික චින්තනයේ වැදගත්කම සාධක සහිතව හෙළි කළේ ය. එහි දී එතුමා පෙන්වා දෙන්නට වූයේ ආර්ථික විද්‍යාඥයන්ගේ මවිතයට හේතුවන තරම් ප්‍රඥාභාවයක් බෞද්ධ ආර්ථික චින්තනයේ ගැබ්ව ඇති බව යි. එච්.එන්.එස්. කරුණාතිලක මහතා තම ***"This Confused Society"*** නම් ග්‍රන්ථයේ දී පෙන්වා දෙන්නේ බුදුසමය ආධ්‍යාත්මික සංවර්ධනය පදනම් කරගත් භෞතික සංවර්ධනයක් අර්ථවත් කර ඇති බව යි. උඩගලදෙණියේ සෝමරංසි හිමියෝ "**බෞද්ධ ආර්ථික චින්තනය**" නම් තම කෘතියේ මෙසේ ප්‍රකාශ කර තිබේ; "**බෞද්ධ ආර්ථික චින්තනයෙහි ධනයට වැදගත් තැනක් ලැබේ. ධනයේ උදව්වෙන් පුද්ගල ජීවිතය සැපවත් කරගත යුතු බව, පිනවිය යුතු බව පිළිගනි යි. මෙය පෞද්ගලිකත්වය මත නො ව, සමාජයේ සැමදෙනාටම පොදු වූ සැපතකි. ජීවීන් විනාශ කරගෙන ආර්ථිකය ගොඩනැංවීම බෞද්ධ ආර්ථික චින්තනයට පටහැනි යි. මිනිසාට හානි කරයි.**" බෞද්ධ ආර්ථික චින්තනය දිළිඳුකම තුරන් කිරීමට පරමාදර්ශී හා පරහිතකාමී මාවතක් බව මෙයින් වඩාත් පැහැදිලි වේ. නූතනයට ගැළපෙන ආර්ථික දර්ශනයක් බුදුසමයේ ඇතැයි පිළිගන්නා මහාචාර්ය, ග්ලෙන් ඇලෙක්සැන්ඩරින් සිය "**බෞද්ධ අර්ථිකය**" *(Buddhist Economic)* නම් ග්‍රන්ථයේ දී අපි අපේ නව ආර්ථිකවිද්‍යාව බෞද්ධ ආර්ථිකවිද්‍යාව යනුවෙන් හඳුන්වන බවත් ඒ කුමන හේතුවක් නිසා ද යත්, එය බුද්ධදහම මෙන් ම විශ්වසාධාරණ ලෙස දැකිය හැකි නිසා බවත් දක්වා තිබේ. මේ අනුව දරිද්‍රතාව නිශේධනයට බුදුදහම ලබා දෙන පිළිතුරු වඩාත් ප්‍රායෝගික බව පෙනේ. බෞද්ධ ආර්ථික දර්ශනයේ අවසාන පරමාර්ථය නිවන යි.

**ප්‍රමුඛ පදඃ** දරිද්‍රතාව, නිර්වචන, සූත්‍ර, පරමාර්ථය

මූලාශ්‍රය


- **අඞ්ගුත්තරනිකාය** 3,4. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **ඛුද්දකනිකාය** 3,4. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **මජ්ඣිමනිකාය** 3,4. (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- **සංයුත්තනිකාය,** 3,4 (2006). බුද්ධජයන්ති ත්‍රිපිටක මුද්‍රණය. දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- බුද්ධදත්ත හිමි, පොල්වත්තේ (2014). **පාලි සිංහල අකාරාදිය,** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- අරියවිල හිමි, කොස්වත්තේ (2010). **බුද්ධ ධර්මය.** කොළඹ: සමයවර්ධන පොත්හල.
- වික්‍රමසිංහ, ජේ.ඩබ්. (2002). **ජනහිතකාමී ආර්ථික සංවර්ධනය.** කොළඹ: ඇස්. ගොඩගේ සමාගම.
- පෙරේරා, ඇන්.එච්. (2005). **දිළිඳුකම පිළිබඳ බෞද්ධ මතය.** දෙහිවල: බෞද්ධ සංස්කෘතික මධ්‍යස්ථානය.
- මනෝජ් රාජපක්ෂ, දිල්ෂාන් (2015). **බෞද්ධ ආර්ථික හා දේශපාලන චින්තනය,** දම්සක් ප්‍රකාශන.
- Hawker, sara (ed.). (2006). **Little Oxford English Dictionary.** New York: oxford University Press.
- ජයවර්ධන, රංජිත්. (2001). **සමෘද්ධි වැඩ සටහන.** ආර්ථිකවිද්‍යා අර්ධ වාර්ෂික අධ්‍යාපන සඞ්ග්‍රහය 02 කාණ්ඩය. 03 කලාපය. නුගේගොඩ: අයි.සී.එම්.එස් ප්‍රකාශන.
- ජබ්බාර්, ශකීලා (2013). **ශ්‍රී ලංකාවේ දරිද්‍රතාව පිළිබඳ විශ්ලේෂණය.** දරිද්‍රතා විශ්ලේෂණය. 2014.
- තෙන්නකෝන්, ඩී. (2003). ශ්‍රී ලංකාවේ දිළිඳුකම අඩු කිරීම සඳහා වූ උපායමාර්ග හා වැඩ සටහන් (ජනවාරි/මාර්තු)
- මල්කාන්ති, එම්.ජී.ජී. (2015). **දිළිඳුකම දිළිඳු කිරීම.**
- මායාදුන්නේ, රොමේශන් (2013). **නාගරික දරිද්‍රතාව මැනීම සඳහා භාවිත මිනුම්වල උපයෝගීතාව,** කොළඹ: දරිද්‍රතා විශ්ලේෂණ කේන්ද්‍රය.
- **ශ්‍රී ලංකා සමාජ ආර්ථික වාර්තා.** (2017/2018).
- **මහ බැංකු වාර්තාව.** (2018), අවසන කාර්තුව.